සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය - 4

විෂය - බුද්ධ ධර්මය

ශ්‍රේණිය - 5

2021 ජුනි මාසය

සැකසුම : රේණුකා කුමාරි මිය - බලන්ගොඩ අධ්‍යාපන කලාපය

## උපන් දිනයට බෝධි පූජා පින්කමක් 1-කොටස

ආදරණීය දුවේ පුතේ ඔයාලා ආසාවෙන් බලා ඉන්න දවසක් ගැන තමයි මම අද ඔයාලට කතා කරන්න යන්නේ ,ඔයාලා හැමෝම ආසයි නේද ඔයාලගේ උපන්දිනේ දවස ළං වෙනවට.

ඉතින් මගෙ දුවේ පුතේ ඔයාලා වගේම යාළුවො ටිකත් එකතු වෙලා එයාලගෙ යාළුවන්ගෙ උපන් දිනය සමරපු ආකාරය දැන ගන්න ඔයාලා ආසයි නේද ?

අපි අපේ පෙළපොත අරගෙන 6. උපන් දිනයට බෝධි පූජා පින්කමක් පාඩම හඩ නගා කියවමු නේද?

හොඳයි මගෙ දරුවනේ ඔයාල කියන්නකෝ බලන්න.

1) අපට බෝධි පූජාවක් පැවැත්වීමට අවශ්‍ය දේවල් මොනවාද කියලා .ඒවා ලියන්නකෝ බලන්න.

2) බෝධි පූජාවක් පැවැත්වීමට පෙර පන්සලට ගොස් අපකළ යුත්තේ මොනවාදැයි ලියන්නකෝ.

3) නිවැරදිව ගලපා යා කරමු.

| | |
|---|---|
| ➢ ආරෝග්‍යා පරමා ලාභා | සතුට උතුම්ම ධනයයි. |
| ➢ සන්තුට්ඨි පරමං ධනං | නීරෝගීකම උතුම්ම ලාභයයි. |
| ➢ සාධු වාචාය සංවරෝ | වචනයෙන් සංවර වීම යහපත්ය |

බුද්ධ ධර්මය විෂයට අදාළ වීඩියෝ enanapiyasa වෙබ් අඩියේ සුහුරු පාඩම් යටතේ ලබා ගත හැකිය